**<u>මහනුවර මහා නගර සභාවේ මහජනධාර දෙපාර්තමේන්තුව සඳහා ශ්‍රම මිලදීගැනීමේ පදනම මත</u>**
**<u>මුල් ළමාවිය සංවර්ධන උපකාරක සේවය ලබා ගැනීම</u>**

මහනුවර මහා නගර සභාවේ සේවා අවශ්‍යතාවය මත ශ්‍රම මිලදීගැනීමේ පදනම මත සිංහල - දෙමළ හා සිංහල ඉංග්‍රීසි භාෂා හැසරවිය හැකි මුල් ළමාවිය සංවර්ධන උපකාරක නිලධාරින්ගේ සේවාව ලබාගැනීමට නියමිත සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව අයදුම්පත් බහාලන කවරයෙහි වම්පස ඉහල කෙළවරෙහි සේවාවේ නාමය සඳහන් කර 2025.04.21 දිනට ප්‍රථම නාගරික කොමසාරිස්, මහනුවර මහා නගර සභාව, මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**<u>මුල් ළමාවිය සංවර්ධන උපකාරක සේවය</u>**

| | | | |
|---|---|---|---|
| 1. | මිලදී ගැනීමට නියමිත සේවාව | : | ශ්‍රම මිලදීගැනීමේ පදනම මත සිංහල - දෙමළ හා සිංහල ඉංග්‍රීසි භාෂා හැසරවිය හැකි මුල් ළමාවිය සංවර්ධන උපකාරක නිලධාරින්ගේ සේවාව ලබාගැනීම |
| 2. | මාසික දීමනාව | : | මාසික දීමනාව රු. 52440/- කි (මසකට දින 21 ක් රාජකාරි ඉටු කිරීම සඳහා) |
| 3. | කායික සුදුසුකම් | : | අදාල සේවාව ලබා දීමට ප්‍රමාණවත් තරම් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය. |
| 4. | අධ්‍යාපන සුදුසුකම් | : | සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් 02 (දෙකකට) සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් 06 (හයකින්) අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම<br><br>හා<br><br>අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් 01 (එකක්වත්) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා ඉංග්‍රීසි විෂය හැර) සමත්ව තිබීම<br><br>හා<br><br>**<u>සිංහල - දෙමළ සේවාවට අයදුම්කරන අයදුම්කාරියන් සඳහා</u>**<br>අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී සිංහල සහ දෙමළ විෂයයන් සඳහා සාමාර්ථයක් ලබාදීම<br><br>**<u>සිංහල - ඉංග්‍රීසි සේවාවට අයදුම්කරන අයදුම්කාරියන් සඳහා</u>**<br>අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී සිංහල සහ ඉංග්‍රීසි විෂයයන් සඳහා සාමාර්ථයක් ලබාදීම<br><br>හා<br><br>**<u>විශේෂ සුදුසුකමක් ලෙස</u>**<br>අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උ.පෙළ) විභාගවලදී චිත්‍ර කර්මය, සංගීතය, නැටුම් යන සෞන්දර්යය විෂයයන්ගෙන් සමත්ව තිබීම |
| | වෘත්තීය සුදුසුකම් | : | පූර්ව පාඨශාලා අධ්‍යාපනය පිළිබඳ විවෘත විශ්ව විද්‍යාලයේ බාහිර සේවා මණ්ඩලය මගින් නිකුත් කරන පූර්ව පාසල් අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමාව<br><br>හෝ<br><br>ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශයේ ළමා ලේකම් කාර්යාලයට යටතේ ලියාපදිංචි කර ඇති ආයතන මගින් පිරිනමනු ලබන පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමාව |

හෝ

මධ්‍යම පළාත් සභාවේ මුල් ළමාවිය සංවර්ධන ඒකකය මඟින් පිරිනමනු ලබන පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමාව

හෝ

තෘතික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අනුමත ආයතන මඟින් පිරිනමනු ලබන පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමාව

**උක්ත ඩිප්ලෝමා පාඨමාලා කාල සීමාව අවම වශයෙන් වසරක් හෝ ඊට වැඩිවිය යුතුය**

5. වෙනත් සුදුසුකම් :

- අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
- බඳවා ගැනීම සඳහා වන සියලු සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
- කාන්තා අයදුම්කරුවන් පමණක් අයදුම්කළ යුතුය.

6. වයස : සියළුම අයදුම්කරුවන් අයදුම්පත් ඉදිරිපත් කරන දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

7. තෝරා ගැනීමේ ක්‍රමය : සුදුසුකම්ලත් නිලධාරීන් පහත කොන්දේසීවලට යටත්ව සේවයට තෝරා ගනු ලැබේ.

- ව්‍යුහගත සම්මුඛ පරික්ෂණයකින් ලබා ගන්නා ලද ලකුණුවල ප්‍රමුඛතාවය අනුව සේවයේ යොදවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව 02කි. (එක් සේවයට එක් අයෙකු බැගින්)
- ව්‍යුහගත සම්මුඛ පරික්ෂණයේ ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරු සේවා සපයා ගැනීම සඳහා යොදවා ගනු ලැබේ.

8. සේවා කොන්දේසි :

- සේවය සපයා ගැනීමේ කාලය බඳවාගැනීමේ දින සිට වසරකි. සේවා අවශ්‍යතාවය මත කාලය දීර්ඝ කිරීම නාගරික කොමසාරිස් විසින් තීරණය කරනු ඇත.
- අවශ්‍ය ඕනෑම අවස්ථාවක සේවය අවසන් කිරීමේ බලය නාගරික කොමසාරිස් සතු වේ.
- තෝරාගත් අයවලුන් යම් අවස්ථාවක සේවයෙන් ඉවත්වේ නම් මාසයකට පෙර දැනුම් දීමක් සිදුකළ යුතුය.
- මෙම සේවයේ යොදවා ගැනීම හුදෙක් සේවා අවශ්‍යතාවය මත පමණක් වන බැවින් රජයේ කිසිදු තනතුරක් දැරීම සඳහා එය අයිතිවාසිකමක් නොවේ.
- තෝරාගන්නා අයදුම්කරු මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සමඟ සේවා ගිවිසුමකට ඇතුළත් විය යුතුය.

සටහන :- මෙම සේවා සපයා ගැනීම සඳහා වන අයදුම්පත් මහනුවර මහා නගර සභාවේ www.kandy.mc.gov.lk වෙබ් අඩවියෙන් බාගත කර ගත හැක. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවශ්‍ය සියළු සුදුසුකම් සපුරා තිබිය යුතු අතර සේවය ලබා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතුවේ. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවාගැනීම ප්‍රමාද කිරීම, වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම, මෙම නිවේදනය සංශෝධනය කිරීම සම්බන්ධ පූර්ණ අයිතිය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතුය.

- අයදුම්කරුවන් ඉහළ වම් කෙළවරේ තමන් අයදුම්කරනු ලබන තනතුර සටහන් කළ යුතුය ("සිංහල - දෙමළ මුල් ළමාවිය සංවර්ධන උපකාරක නිලධාරි තනතුර සඳහා අයදුම්පත්‍රය" "සිංහල - ඉංග්‍රීසි මුල් ළමාවිය සංවර්ධන උපකාරක නිලධාරි තනතුර සඳහා අයදුම්පත්‍රය")

2025.03.28

ඒ.එච්.එම්. ඉන්දිකා කුමාරි අබේසිංහ
නාගරික කොමසාරිස්
මහනුවර මහා නගර සභාව